CCT CENTRE FOR COMBATING TOBACCO

CENTRE FOR COMBATING TOBACCO
Faculty of Medicine, University of Colombo
40/18, Park Road, Colombo 5, Sri Lanka
Tel:+94 112 599 852, +94112581571
Fax: +94112581572
Email: tobaccounmasked@gmail.com
Web: www.cct.lk / www.tobaccounmasked.lk

## ලෝක දුම්වැටි නිවාරණ දිනය - 2019 මැයි 31

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සෑම වසරකම මැයි 31 වන දිනය ලෝක දුම්වැටි නිවාරණ දිනය (WNTD) ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මෙම වසරේ ප්‍රධාන අරමුණ වනුයේ දුම්කොළ භාවිතයෙන් පෙනහළුවලට සිදුවන හානිය සහ ද්විතීය දුම් නිරාවරණය පිළිබඳව දැනුවත් කිරීමයි. මෙම වසර සඳහා ලෝක දුම්වැටි නිවාරණ දිනයෙහි තේමාව "දුම්කොළ සහ පෙනහළු සෞඛ්‍යය" යන්නයි. එමගින්,

- දුම්කොළ/දුම්වැටි මගින් පිළිකාවල සිට නිදන්ගත ශ්වසන රෝග සහ පෙනහළු සෞඛ්‍ය ට ඇති කරන සෘණාත්මක බලපෑම පෙන්වාදීම.
- සියලු ජනතාවගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම උදෙසා පෙනහළුවල මූලික කාර්යභාරය අවධාරණය කරයි.

දුම්පානය ශරීරයේ සෑම අවයවයකටම හානි සිදු කරමින් බොහෝ රෝග ඇති කරයි. එය ශ්වසන පද්ධතිය, රුධිර සංසරණ පද්ධතිය, ප්‍රජනන පද්ධතිය, සම, ඇස්වලට බලපාන අතර විවිධ පිළිකා සඳහා වන අවදානම ද වැඩි කරයි. මේ ආකාරයෙන් ම ද්විතීය දුම්පානයෙහි අවදානම් රහිත මට්ටමක් නොමැත. ද්විතියික දුම්පානය මගින් විශේෂයෙන්ම ළදරුවන් සහ දරුවන්ගේ නිතර වැළඳෙන ඇදුම හා ශ්වසන ආසාදන ඇතුළු සෞඛ්‍ය ගැටලු ඇති කරයි. මිනිසුන් දුම්පානයෙන් ඈත් කරවන ප්‍රතිපත්ති සහ පාලන ක්‍රියාමාර්ගවලට දුම්කොළ කර්මාන්තය මැදිහත් වන බව ඉතා ප්‍රකට කරුණකි.දුම්කොළ කර්මාන්තයේ අවසාන අරමුණ වන්නේ ලොව පුරා මිලියන ගණනක් වන ජනතාවගේ පෙනහළුවලට බලපෑම් ඇති කරවමින් දුම්කොළ පරිභෝජනය වැඩි කිරීම තුළින් ඔවුන්ගේ නිෂ්පාදන වෙළෙඳ පොළ පුළුල් කර ලාභය වැඩිකර ගැනීමයි.

දුම්කොළ කර්මාන්තය විසින් අරමුදල් සපයමින් පර්යේෂණ වාර්තා හරහා අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීම සහ විද්‍යාත්මකව සනාථ කරන ලද කරුණු පදනමකින් තොරව අසත්‍ය ලෙසට ප්‍රචාරය කිරීම, අනුග්‍රාහකත්ව ලබා දීම මගින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් කිරීම, අලෙවිකරණ උපායමාර්ග සහ ප්‍රචාරණ හරහා මහජන අදහස් හැසිරවීම, ආයතනික සමාජ ආයෝජන හරහා ඔවුන්ගේ ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට උත්සාහ කිරීම, දුම්කොළ වගා කටයුතුවලට මැදිහත්වීම, නීති විරෝධී දුම්කොළ වෙළඳාමට සම්බන්ධ වීම, දුම්කොළ බදු සහ මිලකරණය සම්බන්ධ සාවද්‍ය ගැටළු ප්‍රචාරණය කිරීම, දුම්කොළ කර්මාන්තය මගින් දේශීයව භාවිතා කරනු ලබන එවැනි මැදිහත්වීම් කිහිපයකි.

කොළඹ විශ්ව විද්‍යාලයීය වෛද්‍ය පීඨයේ දුම්කොළ කර්මාන්ත අධ්‍යයන කේන්ද්‍රයේ (CCT), තොරතුරු පර්යන්තය වන www.tobaccounmasked.lk හරහා එවැනි මැදිහත්වීම් පිළිබඳ තොරතුරු සොයාගත හැකිය.CCT හි අරමුණ වන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය පිළිබඳ නීතිමය රාමුවෙහි (FCTC) හි 5.3 වගන්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව දුම්කොළ කර්මාන්ත ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමයි, දුම්කොළ කර්මාන්තයේ වාණිජ හා වෙනත් අරමුණු වලින් මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට 5.3 වගන්තියෙහි නිර්දේශ ඉදිරිපත් කර ඇත.ඔබත් එවැනි මැදිහත්වීම් පිළිබද දැනුවත් නම්, ඔබට නොමිලේ බාගත කළ හැකි TU HotSpots ජංගම දුරකතන යෙදවුම හරහා හෝ tobaccounmasked@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය හරහා හෝ නිර්නාමිකව www.cct.lk වෙබ් අඩවිය හරහා CCT වෙත දැනුම් දිය හැකිය. ඔබ සපයන දත්ත පිළිබද රහසිගතභාවය ආරක්ෂා කරනු ඇත.ශ්‍රී ලාංකිකයන් ලෙස, දුම්වැටි දුමාරයෙන් අපගේ පෙනහළු නිදහස් කර ගැනීමෙන් දුම්වැටියෙන් නිදහස් රටක් ගොඩ නැගීමට සහාය වීම අපගේ සාමූහික වගකීමයි.

**වෛද්‍ය මහේෂ් රාජසූරිය**
**අධ්‍යක්ෂ**
**දුම්කොළ කර්මාන්ත අධ්‍යයන කේන්ද්‍රය (CCT)**
**වෛද්‍ය පීඨය,කොළඹ විශ්ව විද්‍යාලය, (2019 මැයි මස 31 වන දින)**